---

**වියදම් ශීර්ෂය - 268**

**කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

**කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ වන උප දිසාපති කාර්යාල වල ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2010**

---

1. **දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්**

i. පහත දැක්වෙන සේවා සැපයීම මඟින් පොදු ජන මට්ටමින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලනය ගෙන ඒම.

* ජාතික හැඳුනුම්පත් හා ගමන් බලපත්‍ර සම්බන්ධයෙන් සේවා ලබාදීම
* චරිත සහතික හා විවාහ නොවූ බවට සහතික නිකුත් කිරීම.
* වැඩ සැලැස්මට අදාළ කටයුතු
* ආගමික කටයුතු හා සදාචාර වර්ධන අමාත්‍යාංශයේ සහාය ඇතිව ආගමික සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය කිරීමට පහසුකම් සැලසීම

ii. ගිණුම්කරණය , වාර්තාකරණය හා වත්කම් ආරක්ෂාව ඇතුළත් මූල්‍ය කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරීම

iii. විශ්‍රාම වැටුප් ගෙවීම් කටයුතු කාර්යක්ෂම කිරීම.

iv. විමධ්‍යගත අයවැය යටතේ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සංවර්ධන කාර්යයන් සම්බන්ධීකරණය

v. වී මිලදී ගැනීම සඳහා ගොවීන්ට වී මිලදී ගැනීම් අත්තිකාරම් ලබාදීම.

vi. ආපදා කළමනාකරණ කාර්යයන්

vii. දිස්ත්‍රික් පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ කාර්යයන්

viii. අවතැන්වූ පුද්ගලයන් සඳහා සහ නැවත පදිංචි කිරීමේ වැඩ සටහන සම්බන්ධයෙන් සේවා ලබාදීම.

ix. අභ්‍යන්තරිකව අවතැන්වූ පුද්ගලයන් සඳහා යටිතල පහසුකම් ඉදිරිකිරීම හා නඩත්තු කිරීම.

x. උපත් , මරණ , විවාහ සහතික නිකුත් කිරීම හා ඉඩම් ලියාපදිංචි කිරීමේ කටයුතු

## 2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන උප දිසාපති කාර්යාලය

(i) පුනාකරි
(ii) කරච්චි
(iii) පච්චලයි පලෙයි
(iv) කන්දාවලි

## 3. වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගිණුම් වර්ෂය ආරම්භයේදී කයාකාර සැලැස්මක් පිළියෙල කර තිබුණි.

## 4. ගිණුම්

### 4.1 මුළු ප්‍රතිපාදනය හා වියදම

කිලනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ඒ යටතේ වූ උප උසාපති කාර්යාල 4 ක් සඳහා සලසා තිබුණු මුළු ප්‍රතිපාදනය රු.125,925,519 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.122,152,436 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා උප දිසාපති කාර්යාල වල ශුද්ධ ඉතිරි කිරීම් රු.3,773,083 ක් වූ අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් 3 % ක් විය. විස්තර පහත දැක්වේ.

| වියදම | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය මුළු ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 76,650,000 | 76,650,000 | 74,151,294 | 2,498,706 | 3.26 |
| මූලධන | 45,550,000 | 49,275,519 | 48,001,142 | 1,274,377 | 2.59 |
| එකතුව | 122,200,000 | 125,925,519 | 122,152,436 | 3,773,083 | 3.00 |

## 4.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් පහත සඳහන් පරිදි එකතුව රු.169,693,122 ක් වූ ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර එම ප්‍රතිපාදන උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ශීර්ෂ අංකය | ප්‍රතිපාදන ලබාදුන් අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | ඉතිරිය (2010 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| 103 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය | 32,000 | - | 32,000 |
| 106 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 1,683,730 | 1,672,800 | 10,930 |
| 118 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 64,500 | 61,911 | 2,589 |
| 120 | ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 1,238,750 | 286,425 | 2,589 |
| 121 | රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 2,000,000 | 2,000,000 | - |
| 124 | සමාජ සේවා අමාත්‍යාංශය | 3,770,312 | 3,147,637 | 622,675 |
| 133 | තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 25,500 | - | 952,325 |
| 140 | පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | 500,000 | 500,000 | - |
| 153 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 304,900 | 259,825 | 45,075 |
| 160 | පරිසර අමාත්‍යාංශය | 400,000 | 397,150 | 2,850 |
| 204 | හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 10,800,000 | 10,542,590 | 257,410 |
| 217 | පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 182,705 | 179,043 | 3,662 |
| 218 | සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 2,704,322 | 1,910,152 | 794,170 |
| 252 | ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | 584,657 | 256,008 | 328,649 |
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 144,158,649 | 113,978,713 | 30,179,936 |
| 254 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 1,278,097 | 1,238,097 | - |
| 286 | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 5,000 | 4,995 | 5 |
| | එකතුව | 169,693,122 | 136,435,346 | 33,257,776 |

## 4.3 විගණනය හා විගණන විෂය පථය

කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා , සැසඳුම් ප්‍රකාශන , පොත්පත් , ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී

ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2011 අගෝස්තු 16 දින දිස්ත්‍රික් ලේකම් වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ , අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් , විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය , මට ලැබී ඇති කාර්ය මණ්ඩලය අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 4.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරියාගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්ට හා රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසි වලට අනුකූලව පවත්වා ගෙනයාම , පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 4.5 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළිබඳ විගණන නිරීක්ෂණය

2010 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙම වාර්තාවේ (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 4.3 සිට 4.13 දක්වා වූ ඡේද වල ඇතුළත් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය වේ.

### (අ) ගිණුම් ඉදිරිපත් කිරීම

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2011 මාර්තු 31 දින වන විට පහත සඳහන් ගිණුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| **ශීර්ෂය / විෂය අංකය** | **ගිණුමේ නම** |
|---|---|
| 268 | විසර්ජන ගිණුම |

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසි | නිරීක්ෂණ |
|---|---|---|---|
| i. | පරිභෝගික ගබඩා ලේඛනය | | |
| ii. | පොත් නාමාවලිය | | |
| iii. | බදු කුලී හා වරිපනම් ලේඛනය | | |
| iv. | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ලේඛනය | මු.රෙ.445 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මෙම ලේඛන පවත්වා නොතිබුණි. |
| v. | විගණන විමසුම් ලේඛනය | | |
| vi. | පිළිපත් ලේඛනය (Counterfoil Books ) | | |
| vii. | මුදල් රැස්කිරීම් ලේඛනය | | |
| viii. | පුද්ගල පඩිනඩි ලේඛනය | | |

(iii) ඉන්වොයිසි , බිල්පත්‍ර , සැසඳුම් ප්‍රකාශ , සනාථ කිරීම් ආදි සාක්ෂි නොමැතිවීම හේතුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ එකතුව රු.1,380,307 ක් වූ ගනුදෙනු විසිපහක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය.

(iv) සමාලෝචිත වර්ෂයේ කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා උප ඍසාපති කාර්යාලයකට නිකුත් කරන ලද විගණන විමසුම් දෙකකට පිළිතුරු 2011 මාර්තු 31 දින දක්වා ඉදිරිපත් කර නොතිබුණු අතර එම විගණන විමසුම් වලට අදාල ගනදෙනු වල ගණනය කළ හැකි වටිනාකම රු.2,424,845 ක් විය.

## (ආ) අග්‍රිම ගිණුම

මුදල් රෙගුලාසි 371 විධිවිධාන වලට පටහැනිව කාර්යය නිමවී මාස 1 සිට මාස 9 ක ප්‍රමාදයකින් පසුව උප අග්‍රිම නිරවුල් කර තිබුණි.

## (ඇ) පොදු තැන්පත් ගිණුම්

වර්ෂ දෙකකට වැඩි කාලයක් වු රු.19,750,542 ක හිමිකම් නොපෑ තැන්පතු ශේෂයන් පිළිබඳව මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ඇ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

(i) 2010 දෙසැම්බර් 31 දිනට වු රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශයට අනුව 2010 දෙසැම්බර් 31 දිනට හිඟ හිට පැවතුණු ශේෂ එකතුව රු.367,895 ක් වු අතර එම හිඟ ශේෂ අයකර ගැනීම පිළිබඳ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ වලට අදාල රෙගුලාසි වල විධිවිධාන වලට අනුකූල වීමෙන් තොරව රු.223,100 ක් වු ණය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ලබාදී තිබුණි.

(iii) මුදල් රෙගුලාසි වලට අනකුලව ණය සහ අත්තිකාරම් වල ශේෂයන් දැක්වෙන පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ණය සහ අත්තිකාරම් කේවල ශේෂ ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

**4.6 වත්කම් කළමනාකරණය**

**(අ) නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්**

මෝටර් වාහනයක් වර්ෂයකට වැඩි කාලයක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ නිෂ්කාර්යව තිබු බව විගණන නියැදි පරික්ෂණ වලදී නිරික්ෂණය විය.

**(ආ) වාර්ෂික සමීක්ෂණ මණ්ඩල පැවැත්වීම**

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 756 හා 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා උප දිසාපති කාර්යාලය විසින් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදුකළ යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා උප දිසාපති කාර්යාල 4 විසින් 2010 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ සදුකර නොතිබුණි.

(ii) පෙර වර්ෂ වල සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් වාර්තා කරන ලද අතිරික්තතා හා ඌනතා සහ වෙනත් නිර්දේශයන් පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 4.7 අනුකූල නොවීම්

### (අ) නීති , රීති , රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණන නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය වු නීති , රීති , හා රෙගුලාසි වල විධිවිධානයන්ට අනුකූල නොවීම් අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | නීති , රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (i). | මුදල් රෙගුලාසි | | |
| | 371(2) | 887,390 | අදාල කාර්යය නිම වු වහාම උප අග්‍රිම නිරවුල් කර නොතිබුණි. |
| | 396 | 11,686,596 | මාස 6 කට වැඩි කාලයක් වු ඉදිරිපත් නොකළ චෙක්පත් පිළිබඳව කටයුතු කර නොතිබුණි. |
| (ii). | අංක 1439 දරන අති විශේෂ ගැසට් පත්‍රය | | නිශ්චිත ගෙවීම් වලින් මුද්දර ගාස්තු අයකර නොතිබුණි. |
| (iii). | ආයතන සංග්‍රහය | | |
| | XIV පරිච්ඡේදයේ 4.9 වගන්තිය | 22,000 | රු.22,000 ක් වු වැඩිපුර ගෙවීම් ගමන් වියදම් ඉල්ලුම් පත් වලින් අයකර ගෙන නොතිබුණි. |
| (iv). | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 වගන්තිය | 2,271,219 | රු.මිලියන 2 කට වැඩි වටිනාකම වු කොන්ත්‍රාත්තු ප්‍රජා පදනම් සංවිධාන වලට ප්‍රදානය කර තිබුණි. |
| (v). | චක්‍රලේඛ විධිවිධාන | | |
| | 1993 නොවැම්බර් 22 දිනැති අංක 89 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලෙඛය | 121,760 | මාසයක් ඇතුළත මාරුවීම් ලද නිලධාරින්ගෙන් අයවිය යුතු ණය අයකර |

ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

(i) නිශ්චිත ගෙවීම් වලින් රු.52,365 ක් වූ රඳවා ගැනීම් බදු අයකර ගෙන නොතිබුණු අතර 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 153 වගන්තිය ප්‍රකාරව නිශ්චිත ගෙවීම් වලින් අයකරන ලද රු.142,332 ක් වූ රඳවා ගැනීම් බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ප්‍රේෂණය කර නොතිබුණි.

(ii) ඉහත පනත ප්‍රකාරව , ප්‍රසම්පාදනයකදී බිල් වටිනාකම මත 5% ක් රඳවා ගැනීම් බදු ලෙස අයකර ගත යුත වුවද රු.53,145 ක් වූ ගෙවීමකින් 1% ක් පමණක් අයකර ගෙන තිබුණි.

## 4.8 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

**(අ) ව්‍යාපෘති ක්‍රියාත්මක කරමේ ප්‍රමාදයන්**

කන්දාවලි උප දිසාපති කාර්යාලයේ ජලය උරා ගන්නා වලක සහ සීල් කරන ලද වලක ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු පිරිවැය වූ රු.195,000 ක් කොන්ත්‍රාත්කරුට සම්පූර්ණයෙන් ගෙවා තිබුණද , මෙම වාර්තාවේ දිනය දක්වා ඉදිකිරීම් වැඩ නිමකර නොතිබුණි.

## 4.9 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

**(අ) බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ දීර්ඝ ප්‍රමාදයන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ බැංකු ගිණුමට අදාලව සමාලෝචිත වර්ෂයේ බැංකු සැසඳුම් ප්‍රකාශන හා ශේෂ සනාථ කිරීමේ ලිපි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) ගැලපුම් කළ යුතු ශේෂ**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා උප දිසාපති කාර්යාල 4 විසින් 2010 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශන වල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයකට අනුව වටිනාකම රු.11,686,569 ක් වටිනාකම වූ චෙක්පත් 32 ක් නිකුත් කර තිබුණු නමුත් මාස 6 කට වැඩි කාලයක් ගෙවීම සඳහා ඉදිරිපත් කර නොතිබුණු බව අනාවරණය විය.

## 4.10 වංචනික ස්වරූපයේ ගනදෙනු

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

එල්ලෙන ලාම්පු 10 ක් හා බැටන් ලාම්පු සවි කිරීම සඳහා රු.18,660 ක මුදලක් ගෙවා තිබුණද සැපයුම් මාර්ගයට ලාම්පු සම්බන්ධ කර නොතිබුණි. එසේම සැලසුම් ශාඛාවට එල්ලෙන ලාම්පු 6 ක් හා බැටන් ලැම්පු සවි කිරීම සඳහා රු.11,196 ක මුදලක් ගෙවා තිබුණි. එහෙත් සවි කළ බවට දකවන ලද ලාම්පු භෞතික පරීක්ෂණයේදී සවිකර නොතිබුණි. එබැවින් ඉහත දකවන ලද ගෙවීම් දෙක වංචනික බවට විගණනයේදී නිරීක්ෂණය විය.

## 4.11 පාඩු හා හානි

පහත දැක්වෙන පාඩු හා හානි අවස්ථා නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| | හානි පිළිබඳ ස්වභාවය | මුදල |
|---|---|---|
| | | රු. |
| (අ) | ජෙනරේටරයක් නැතිවීම | 10,000 |
| (ආ) | ලැප්ටොප් පරිගණකයක් නැතිවීම | 122,000 |
| | එකතුව | 132,000 |

## 4.12 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු

2010 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i). | ජ්‍යෙෂ්ඨ මට්ටම | 32 | 11 | 21 |
| (ii). | ද්විතීය මට්ටම | 293 | 136 | 157 |
| (iii). | ප්‍රාථමික මට්ටම | 95 | 46 | 49 |
| | එකතුව | 420 | 193 | 227 |

## 4.13 අභ්‍යන්තර පාලනය

**(අ) අභ්‍යන්තර විගණනය**

සමාලෝචිත වර්ෂය තුළදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා සහකාර උප දිසාපති කාර්යාල වල අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**(ආ) විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

සමාලෝචිත වර්ෂය තුළදී දිස්ත්‍රික් ලේකම් හා සහකාර උප දිසාපතිවරුන් විසින් විගණන හා කළමනාකරණ කමිටු කිසිවක් පවත්වා නොතිබුණි.